**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය - 2014**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 වැනි දිනට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 06 දෙනෙකු සහ කම්කරු අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු ආයතනයෙහි සේවයේ යොදවා වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.3,039,599 ක් දෙපාර්තමේන්තුවේ හා අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන්ගෙන් ගෙවා තිබුණි. මෙම වියදම ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැලපුම් කර නොතිබුණි.

(ආ) ඇස්තමේන්තු වටිනාකම රු.1,250,000 ක් වූ වටිනාකමකින් යුක්ත වෑන් රථය ආයතනයේ සංචිත වාහනයක් ලෙස පරිහරණය කළ ද එහි අයිතිය පවරා ගැනීමෙන් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් සහ සමුච්චිත අරමුදලට සටහන් කර තිබුණි.

(ඇ) 2013 අගෝස්තු මාසයේදී ගෙවා තිබූ රු.25,000 ක චෙක්පතක් අස්ථානගත වීම හේතුවෙන් 2014 වර්ෂයේදී නැවත චෙක්පත නිකුත් කිරීමේදී නිවැරදිව ගිණුම්ගත නොකිරීම නිසා 2014 වර්ෂයේ වෙනත් ආදායම් සහ කළමනාකරණ දීමනා රු.25,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු.506,700 ක පාඨමාලා ගාස්තු ආදායම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 ප්‍රකාරව තොග වෙනමම මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය කළයුතු වුවද ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වර්ෂය අවසාන තොග පිරිවැය වර්ෂයේ ලාභයට එරෙහිව කපා හැර තිබුණි.

(ඊ) ආයතනික නාම පුවරුව ආලෝකමත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් රු.295,300 ක් වටිනා උපකරණ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට අයහාර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ නිසා වර්ෂයේ අතිරික්තය සහ වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් නිරූපණය වේ.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන ගැලපීම් ලෙස රු.4,986 ක අගයක් දක්වා තිබුණු අතර එම වටිනාකම සනාථ කර ගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.3 නීතිරීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ 4(ඉ) වගන්තිය | ආයතනයේ රු.මිලියන 17 ක පමණ සාමාන්‍ය ශේෂයක් වර්ෂය පුරා පැවතියදී එම මුදල් ආයෝජනය කර ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 | ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 6 ඉක්ම වූ එකතුව රු.40,750 ක්වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,491,642 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.502,932 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,988,710 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. වාර්ෂික වියදම් සියයට 30 කින් අඩුවීම හා පාඨමාලා ආදායම සියයට 17 කින් ඉහළ යාම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක සමාලෝචනය**

2013 වර්ෂයේදී ආදායමට සාපේක්ෂව වියදම් අනුපාතය සියයට 98 ක් වුවත් එය 2014 වර්ෂයේදී සියයට 79 ක් දක්වා අඩුවී ඇති අතර පෙර වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් ආදායම සියයට 17 කින් ඉහළ ගොස් තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

2014 වර්ෂයේ සිට 2015 පළමු කාර්තුව දක්වා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙනුවෙන් පිළියෙල කළ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සහ ඉලක්ක ඉටුවීමේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වැඩබිම් ඵලදායිතා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම ඉලක්ක කර එය පවත්වා තිබූ අතර ඉලක්ක කළ ආදායම රු.920,000 ක් වුවද ලැබුණු ආදායම රු.540,000 ක් විය. ආදායම ඉපයීම රු.380,000 කින් පහත වැටී තිබුණි.

(ආ) මානව සම්පත් කළමනාකරණ තුන්දින ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පුහුණු වැඩසටහන් 2 ක්ද, කම්කරු හා කම්කරු සබඳතා දෙදින ඩිප්ලෝමා පාඨමාලා සඳහා පුහුණු වැඩසටහන් 10 ක්ද, මානව සම්පත් කළමනාකරණ දෙදින ඩිප්ලෝමා පුහුණු වැඩසටහන් 9 ක්ද පැවැත්වීමට ඉලක්ක කර තිබුණු අතර පිළිවෙලින් පාඨමාලා 01 ක් , 07 ක් සහ 07 ක් පමණක් පවත්වා තිබුණි.

(ඈ) විධායක මට්ටමේ නිලධාරීන් සඳහා වෙළඳ සංගම් පුහුණු පාඨමාලාව සඳහා පුහුණු වැඩසටහන් 16 ක් පැවැත්වීමට ඉලක්ක ගත කර තිබූ අතර පාඨමාලා 4 ක් පමණක් පවත්වා තිබුණි. වැඩසටහන් 12 ක් නොපැවත් වුවද රු.1,020,000 ක් වූ ඉලක්කගත ආදායම අඩු වී තිබුණේ රු.370,000 කින් පමණි.

(ඇ) ආයතනය විසින් මූල්‍ය හා භෞතික ඉලක්ක ඉටුකර ගැනීම නිසි අධ්‍යයනයකින් හා තාර්කානුකූලව සිදු කර නොමැති බව උක්ත ඉලක්ක ඉටුකිරීමේ ප්‍රගතිය අනුව නිරීක්ෂණය කෙරේ.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ 3 (ඇ) ඡේදය පරිදි පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම සහ ඒවා නඩත්තු කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණක් වුවද පසුගිය වසර කිහිපයක සිට පුස්තකාලයෙන් පොත් බැහැර දීමක් මෙන්ම එවා පරිහරණය කිරීමක්ද සිදු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂය සඳහා ආයතනයට ලැබුණු රු.89,500 ක් ආයතනය විසින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ බැංකු ගිණුමට බැරකර තිබූ අතර, එය මෙතෙක් ආපසු ලබා ගෙන ගිණුම් නිවැරදි කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 750 ප්‍රකාරව ආයතනයේ තොග පොත යාවත්කාලීන කරමින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වත්කම් 2013 ඔක්තෝබර් 02 දින තක්සේරු කර ඇති අතර තක්සේරු වටිනාකම් 2014 දෙසැම්බර් 31 දිනට වූ වටිනාකම් ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණු අතර තක්සේරු වටිනාකම් වර්ෂයකින් පමා වීම පිළිබඳව නොසලකා හැර තිබුණි.

(ඇ) ආයතනය, ජාලගත පරිගණක වැඩසටහන් සමඟ හෝ වෙනත් පරිගණක මෙහෙයුම් වැඩසටහන් සමඟ හෝ සම්බන්ධ කර නොතිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී ලැප්ටොප් පරිගණක 06 ක් රු.1,109,400 කට මිලදී ගෙන තිබුණි.

(ඈ) ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් 2015 ජනවාරි 13 දින ආයතනයෙන් ඉවත්ව ගියද ඔහු වෙත ලබා දුන් රු.184,900 ක් වටිනා ලැප්ටොප් පරිගණකය ආපසු ආයතනයට භාර දී නොතිබුණු අතර ආයතනය විසින් නිත්‍ය තනතුර සහ වැඩබලන තනතුර සඳහා ලැප්ටොප් පරිගණක 2 ක් එක් නිලධාරියෙකු වෙත ලබා දී තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 45 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 16 ක් අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තු සේවකයන්ගෙන් සමන්විත වූ අතර තවදුරටත් කාර්ය මණ්ඩලය 29 දෙනෙකුගෙන් පුරප්පාඩු වී තිබුණි. මෙම කාර්ය මණ්ඩලයෙහි ගණකාධිකාරි තනතුර සඳහා පමණක් ආයතනය විසින් බඳවා ගැනීම සිදුකර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවද ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශන මාස 03 ක ප්‍රමාදයකින් පසුව එනම් 2015 මැයි 28 දින ඉදිරිපත් කර තිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

2014 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අධිකාරිලත් නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුල මිලදී ගැනීම සඳහා සැලසුම් කළ පරිගණක මුද්‍රණ යන්ත්‍ර 03ක්, ෆැක්ස් යන්ත්‍ර 03 ක් සහ ඩිජිටල් කැමරාවක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) සේවක මණ්ඩල කළමනාකරණය
(ඈ) මූල්‍ය පාලනය
(ඉ) ප්‍රසම්පාදන කටයුතු